සියලුම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
Provincial Department of Education - NWP

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව Provincial Department of Education

## තෙවන වාර පරීක්ෂණය - 7 ශ්‍රේණිය - 2019
## Third Term Test - Grade 7 - 2019

නම/විභාග අංකය :....................................... බුද්ධ ධර්මය කාලයඃ පැය 02යි.

සැලකිය යුතුයි :
- පළමු කොටසේ ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න. එක් ප්‍රශ්නයක් සඳහා ලකුණු දෙක බැගින් ලකුණු 40 ක් හිමිවේ.
- දෙවන කොටසේ පළමු ප්‍රශ්නය අනිවාර්ය වේ. ඉතිරි ප්‍රශ්න වලින් හතරක් තෝරා ගෙන පිළිතුරු සපයන්න.

## I කොටස

- **අංක 01 - 05 දක්වා ඇති ප්‍රශ්නවලට වඩාත් ගැළපෙන පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.**

(1) බුදුරජාණන් වහන්සේ සත් සතිය ගත කරන විට බුද්ධ ශරීරයෙන් බුදුරැස් විහිදෙන්නට පටන් ගත්තේ .... ?
1. පළමු සතියේ දී ය
2. දෙවන සතියේ දී ය.
3. හතරවන සතියේ දී ය.
4. හත්වන සතියේ දී ය

(2) පස්වග මහණුන්ට රහත් භාවය ලබා ගැනීමට පදනම් වූ සූත්‍රය වන්නේ....?
1. දම්සක් පැවතුම් සූත්‍රය යි.
2. අනන්ත ලක්ඛන සූත්‍රය යි.
3. මංගල සූත්‍රය යි.
4. කරණීය මෙත්ත සූත්‍රය යි.

(3) බුදුරජාණන් වහන්සේ ගිලානෝපස්ථානයේ ඇති වටිනාකම ආදර්ශයෙන් ලොවට පෙන්නුම් කළේ............?
1. සෝපාකට පිහිට වීමෙන් ය.
2. පටාචාරාවන්ට පිහිට වීමෙන් ය.
3. පූතිගත්තතිස්ස හිමිට පිහිටවීමෙන් ය.
4. සුනීතට පිහිට වීමෙන් ය.

(4) නව අරහාදී බුදු ගුණ අතරට අයත් නොවන්නේ මින් කුමක් ද?
1. බුද්ධ ගුණයයි
2. සුගත ගුණයයි.
3. ඒහි පස්සිකෝ ගුණයයි.
4. ලෝක විදූ ගුණයයි.

(5) කරණීය මෙත්ත සූත්‍රයෙහි සියලු සත්ත්වයෝ යන්නට අරුත් ගන්වා ඇති ''තසා'' යන්නෙහි තේරුම...?
1. තැති ගන්නා සුළු සත්ත්වයෝ ය.
2. මිටි ශරීර ඇති සත්ත්වයෝ ය.
3. ඇසට පෙනෙන සත්ත්වයෝ ය.
4. උපතක් ඇති සත්ත්වයෝ ය.

- **අංක 06 - 10 දක්වා ඇති ප්‍රශ්නවලට ගැළපෙන පිළිතුරු වරහන් තුළින් තෝරා ලියන්න.**
**(කාම තණ්හා ව / පටිසෝතගාමී, / අනේ පිඩු සිටුතුමා/ භව තණ්හා / අනුසෝතගාමී / ගිරිමානන්ද / බිම්බිසාර රජතුමා/ ව්‍යග්ඝ පජ්ජ)**

(6) බුදු සසුනේ අග්‍ර ශ්‍රාවකයා වන්නේ ....................................................................... ය.

(7) බුදු දහම ..................................................................... ය. එනම් උඩු ගං බලා යාමට මඟ පෙන්වන්නකි.

(8) ඇස, කණ, නාසය, ශරීරය යන පංචේන්ද්‍රියන් පිනවීමට ඇති කැමැත්ත ..................................................................... යි.

(9) වේළුවනාරාමය බුදු රදුන්ට පූජා කළේ ..................................................................... ය.

(10) බුදුරජාණන් වහන්සේ රෝග හට ගන්නා ක්‍රම අටක් පිළිබඳව ..................................................................... සූත්‍රයේ දී දේශනා කළ සේක.

- **ප්‍රශ්න අංක 11 - 15 දක්වා ඇති ප්‍රශ්නවලට අදාල ප්‍රකාශ හරි නම් (✓) ලකුණ ද වැරදි නම් (✗) ලකුණ ද ඉදිරියේ ඇති වරහනෙහි යොදන්න.**

(11) මාතලේ අලු විහාරයේ දී සිව්වන ධර්ම සංගායනාව සිදු කළේ ය. ( )

(12) විහාරස්ථානයට ගොස් මුලින් ම වන්දනා කරන්නේ පාරිභෝගික චෛත්‍යයයි ( )

(13) රෝගියාගේ සිත සැනසෙන කතා පැවසීම උපස්ථායකයකු සතු ගුණාංගයක් නොවේ. ( )

(14) ප්‍රථම ධර්ම සංගායනාවට සහභාගි වූ රහතන් වහන්සේලා ගණන පන්සිය නමකි. ( )

(15) උරුවෙල් දනව්වේ ජටිල සහෝදරයෝ දෙදෙනෙක් වාසය කළහ. ( )

(ල. 2 × 5 = 10)

- **ප්‍රශ්න අංක 16 - 20 දක්වා ඇති ප්‍රශ්නවල ''අ'' තීරුවට ගැලපෙන පිළිතුර 'ආ'' තීරුවෙන් තෝරා එහි අංකය වරහන තුළ ලියන්න.**

| | (අ) | | | (ආ) |
|---|---|---|---|---|
| (16) | නිවැරදි දැක්ම | ( ) | (i) | උඳුවප් පුර පසලොස්වක පෝය. |
| (17) | ශරීරයට අධික සැප දීම | ( ) | (ii) | පූර්වාරාමය |
| (18) | අත්තූපනායික ධර්ම පර්යාය | ( ) | (iii) | කාම සුඛල්ලිකානු යෝගය |
| (19) | විශාඛා මහ උපාසිකාව | ( ) | (iv) | සම්මා දිට්ඨි |
| (20) | ජය ශ්‍රී මහා බෝධිය | ( ) | (v) | ලෝකාධිපති |

(ල. 2 × 5 = 10)

## II කොටස

- **පළමු වන ප්‍රශ්නය ඇතුළු ව ප්‍රශ්න 5 කට පිළිතුරු සපයන්න.**

(1) කෙටි පිළිතුරු සපයන්න.

(i) ඍතු නියාමයට අනුව සොබාදහමේ සිදුවන වෙනස්කම් 2 ක් ලියන්න.

(ii) ආනන්ද බෝධිය රෝපනය කර ඇති ස්ථානය කුමක් ද?

(iii) බුදු සසුනේ පළමු ද්වේවාචික උපාසකවරු කවුරුන්ද?

(iv) ධන පරිහරණය පිළිබඳ බුදුරජාණන් වහන්සේ දේශනා කළ සූත්‍රය කුමක් ද?

(v) සිරිත් හා විරිත් යන වචන දෙකේ තේරුම ලියන්න.

(vi) පහත කවිය සම්පූර්ණ කරන්න.

සිව් සස් සිය නැණින් දුන දූක්විය කුළුණින්

.........................................................................................

(vii) සුණාපරන්ත දේශයට භාවනා කිරීමට වැඩම කළ භික්ෂූන් වහන්සේ කවුරුන් ද?

(viii) බෞද්ධයෙකු විසින් අත්හල යුතු අන්ත 2 ලියන්න.

(ix) මිහිඳු මහ රහතන් වහන්සේ සමග ලංකාවට වැඩම කළ රහතන් වහන්සේලා දෙනමකගේ නම් ලියන්න.

(x) බෞද්ධයාගේ අත්පොත යනුවෙන් හඳුන්වන ග්‍රන්ථයේ නම කුමක් ද?

(ල. $2 \times 10 = 20$)

(2) (i) ගුරු / සිසු යුතුකම් සඳහන් වන සූත්‍ර දේශනාවේ නම ලියන්න. (ල. 2)

(ii) ශිෂ්‍යයාගෙන් ගුරුවරයාට ඉටුවන යුතුකම් 3 ක් ලියන්න. (ල. 3)

(iii) ගුරු බසට හොඳින් සවන් දී ඉගෙන ගැනීමෙන් ඔබට ලැබෙන ප්‍රයෝජන 5 ක් පෙළ ගස්වන්න. (ල. 5)

(3) (i) ''චතුරාර්ය සත්‍ය'' යන්නෙහි අදහස සඳහන් කරන්න. (ල. 2)

(ii) චතුරාර්ය සත්‍ය පිළිවෙලින් නම් කරන්න. (ල. 3)

(iii) චතුරාර්ය සත්‍ය ඉගෙන ගැනීමෙන් ශිෂ්‍ය ජීවිතයට ලැබෙන ප්‍රයෝජන 5 ක් ලියන්න. (ල. 5)

(4) (i) එදිනෙදා ජීවිතයේදී අපට ඇති සම්පත් අරපිරිමැස්මෙන් තොරව භාවිතා කිරීමේ අනිටු විපාක 2 ක් ලියන්න. (ල. 2)

(ii) අප උපයා ගන්නා ධනය ප්‍රධාන කොටස් 4 කට බෙදා පරිහරණය කළ යුතු ආකාරය බුදුරජාණන් වහන්සේ දේශනා කළ සේක. එයින් 3 ක් නම් කරන්න. (ල. 3)

(iii) සම්පත් අරපිරිමැස්මෙන් භාවිතා කළ යුතු ආකාරය දක්වෙන ආදර්ශ පාඨ 5 ක් සකස් කර ලියන්න. (ල. 5)

(5) (i) සබ්බේ තසන්ති දණ්ඩස්ස සබ්බේ සං ජීවිතං පියං...... යන ගාථාව සම්පූර්ණ කරන්න. (ල. 2)

(ii) ඉහත සඳහන් ගාථාවේ අර්ථය සැකවින් දක්වන්න. (ල. 3)

(iii) තමන් උපමාවට ගෙන අන් අයට හිංසා පීඩා කිරීමෙන් වැළකීම උතුම් ගුණාංගයකි. ශිෂ්‍යයකු ලෙස මේ පිළිබඳව කෙටි අදහසක් ඉදිරිපත් කරන්න. (ල. 5)

(6) (i) ''සිරිත් මල්දම'' කෘතිය රචනා කළේ කවුරුන්ද? (ල. 2)

(ii) ඇඳුමට වැඩි වියදම් නොකරන්නේ .......... යන කවිය සම්පූර්ණ කරන්න. (ල. 3)

(iii) ආදර්ශමත් සිසුවෙකු වීමට පාසලේදී අනුගමනය කළ යුතු සිරිත් විරිත් 5 ක් ලියන්න. (ල. 5)

සියලුම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# Provincial Department of Education - NWP

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව Provincial Department of Education වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව Provincial Department of Education

## තෙවන වාර පරීක්ෂණය - 7 ශ්‍රේණිය - 2019
## Third Term Test - Grade 7 - 2019

### බුද්ධ ධර්මය - පිළිතුරු පත්‍රය

### I කොටස

(1) 3
(2) 2
(3) 3
(4) 3
(5) 1
(6) අනේපිඬු සිටුතුමා
(7) පටිසෝතගාමී
(8) කාම තණ්හාව
(9) බිම්බිසාර රජතුමා
(10) ගිරිමානන්ද
(11) ✓
(12) ✗
(13) ✗
(14) ✓
(15) ✗
(16) සම්මා දිට්ඨි
(17) කාමසුඛල්ලිකානු යෝගය
(18) ලෝකාධිපති
(19) පූර්වාරාමය
(20) උඳුවප්පුර පසලොස්වක පෝය

(ල. $2 \times 20 = 40$)

### II කොටස

(1) (i) ශාක හට ගැනීම / මල් හට ගැනීම / ඵල හට ගැනීම / කොළ හැලීම / සුළං හැමීම/ වැසි ඇති වීම.... ආදී කරුණු

(ii) දෙව්රම් වෙහෙර (ජේතවනාරාමය)

(iii) තපස්සුභල්ලුක

(iv) සිඟාලෝවාද සූත්‍රය

(v) කළ යුතු දේ හා නොකළයුතු දේ (සමාදානය හා විරමනය)

(vi) දුරලයි අනුවණයින් එබඳු නම් වීය ගුණ පමණින්

(vii) පුණ්ණ තෙරුන් වහන්සේ

(viii) අත්තකිලමතානු යෝගය හා කාමසුඛල්ලිකානු යෝගය

(ix) ඉට්ටිය, උත්තිය, සම්බල, භද්දසාල රහතන් වහන්සේලාගෙන් දෙදෙනෙකු

(x) ධම්ම පදය (ල. $2 \times 10 = 20$)

(2) (i) සිඟාලෝවාද සූත්‍රය (ල. 2)

(ii) ගුරුතුමා දුටු විට හුනස්නෙන් නැගිටීම
ඇප උපස්ථාන කිරීම.
හොඳින් සවන් දීම හා පිළිගැනීම
අවශ්‍ය කටයුතු සිදුකර දීම.
හොඳින් ඉගෙන ගැනීම. (ල. 3)

(iii) සිසුන් ලියා ඇති පිළිතුර සළකා බලා ලකුණු පිරිනමන්න. (ල. 5)

(3) (i) උතුම් ඇත්ත හතරක් යන්නයි. (ල. 2)

(ii) දුක්ඛ ආර්ය සත්‍යය
දුක්ඛ සමුදයාර්ය සත්‍යය
දුක්ඛ නිරෝධ සත්‍යය
දුක්ධ නිරෝධ ගාමිණී පටිපදා සත්‍යය (ල. 3)

(iii) ලියා ඇති පිළිතුරේ සමස්ථය ගැන සැලකිමත් වී ලකුණු පිරිනමන්න.
(16 වන පාඩම පරිශීලනය කරන්න) (ල. 5)

(4) (i) මුදල් නාස්ති වීම, කාලය නිකරුණේ ගෙවී යාම, කළ යුතු වැඩ කල්යාම, සම්පත් වල හීනතාවයක් ඇතිවීම, නිසි කළමනාකරණයක් නොමැති වීම නිසා නොයෙකුත් ප්‍රශ්න ඇතිවීම. (ල. 2)

(ii) එක් කොටසක් පරිභෝජනය සඳහා ද, කොටස් 2 ක් නැවත ආයෝජනය සඳහා ද, ඉතිරි කොටස ආපදාවකදී ගැනීමට ඉතිරි කිරීමට ද යොදාගත යුතු බව (ල. 3)

(iii) ලියා ඇති පිළිතුරේ සමස්තය ගැන සැළකිළිමත්ව අදාල ලකුණු පිරි නමන්න. (ල. 5)

(5) (i) සබ්බේ තසන්ති දණ්ඩස්ස

සබ්බේ සං ජීවිතං පියං

අත්තානං උපමං කත්වා

නහනෙය්‍ය න ඝාතයෙ (ල. 2)

(ii) සියල්ලෝ දඬුවමට බිය වෙති. සියල්ලන්ම ජීවිතයට ප්‍රියයි. මෙසේ අනුන් තමා මෙන් සළකා, අනුන්ට හිංසා පීඩා නොකළ යුතුය. අනුන් ඝාතනය නොකළ යුතුය. ඝාතනය නොකර විය යුතු ය. (ල. 2)

(iii) ශිෂ්‍යයා ප්‍රායෝගිකව ලියා ඇති පිළිතුරේ සමස්තය ගැන විශේෂ සැලකිල්ලක් දක්වා අදාල ලකුණු පිරි නමන්න. (ල. 5)

(6) (i) ඇම්. ඇල්. සිල්වා ගුරු මුහන්දිරම් තුමා (ල. 2)

(ii) ඇඳුමට වැඩි වියදම් නොකරන්නේ

වැඩි කොට ඇඳුමුත් ඇඳ නොම ගන්නේ

ගමනට ගෙදරට එක නාඳින්නේ

වයසට පමණට ඇඳුම් අඳින්නේ (ල. 3)

(iii) ශිෂ්‍යයා ලියා ඇති පිළිතුරේ සමස්තය කෙරෙහි අවධානය යොමුකර අදාල ලකුණු පිරි නමන්න.
(පොළ පොතේ 8 පාඩමේ 59, 60 පිටු පරිශීලනයට ලක් කරන්න) (ල. 5)